# කුරුළු තාත්තා සහ කුරුළු අම්මා



ඕෂියානා ශෙල්බි රත්නායක ඉහළගමගේ

# කුරුලු තාත්තා සහ කුරුලු අම්මා


**<u>කතාව සහ  රූප නිර්මාණය</u>**

**ඕෂියනා ශෙල්බි රත්නායක ඉහලගමගේ**

**2 වසර E**

**මහමායා බාලිකා විදුහල , මහනුවර**



**2023.11.15**

**ISBN – 978-624-206-871-8**


**<u>කතෘ ගේ වෙනත් කෘති</u>**

1. සරුංගල්  බිංදු
2. සමනල මල

3.සමදරා

4.හඳ හාමි මගේ අතේ

5.පුංචි සමනලී

6.මම ආසම පාට

7.සල්මලී

8. පුංචි වලස් පැටියා

9.මලිති බබා

මා හට අකුරු කියා දුන් මගේ අච්චාටත්, අම්මාටත් සෑම අයුරින් මා හට උදව් උපකාර කළ චාමිනි පල්ලියගුරු මාගේ පංතිභාර ගුරුතුමියටත් ආදරයෙන් පුදමි !



පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශෂිකලා සේනාධීර

විදුහල් පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර

2023 10 20

එක කැලෑවක ගස් බෙණයක කුරුළු පවුලක් ජීවත් වුණා.දවස් ගෙවිලා යද්දී ලොකු සීත කාලයක් ආවා.

ඒක හරිම අමාරු කාලයක්. කුරුළු අම්මාටයි තාත්තාටයි තමන්ගේ පැටවුන් ගැන බයක් දැනුණා.



මොකද මේ සීත කාලය නිසා තම පැටවුන්ට කරදරයක් වෙයි කියලා.

ගස් බෙණය ඇතුලෙම අම්මයි තාත්තයි පැටවුන් ටිකත් තුරුළු කරගෙනම මුළු දවසම ගතකළා.



කෑමක් සොයා යෑමටත් අමාරුවෙන විදිහට මේ සීත කාලය එන්න එන්නම වැඩි වුණා. පුංචි පැටවුන් එකදිගටම අඬන්න ගත්තා. කුරුළු අම්මාටයි තාත්තාටයි හරිම දුකයි.

කුරුළු තාත්තා කෑම සොයා යන්නට තීරණය කළත් අම්මා නම් ඒකට අකමැති වුණා. මොකද මේ සීත කාලය පැටවුන්ට විතරක් නෙමෙයි අනිත් සතුන්ටත් අමාරු වුණා.



ඒත් එන්න එන්නම පැටවුන් ටික අඬන්න ගත්තා. පැටවුන් අඬනවා බලන්න බැරිකමට කුරුළු තාත්තා තීරණය කළා සීතලේම කෑම ටිකක් සොයා යන්න. අකමැත්තෙන් වුනත් අම්මා තාත්තාගේ තීරණයට කැමති වුණා.


පැටවුන්ගේ ඔළුව අතගා කුරුළු තාත්තා බෙණය පිටතට පියඹා ගියා. ඔන්න එන්න එන්නම කළුවර වැටෙන්න ගත්තා. සීතලත් වැඩි වුණා. ඒත් කුරුළු තාත්තා ආවේ නෑ.



පැටවුන් ටික තව තවත් අඬන්න ගත්තා. කුරුළු අම්මාත් ගොඩක් බය වුණා. බෙණය පිටතට ඇවිත් ටික වෙලාවක් කැලෑව දිහා බලන් හිටියා. ඒත් කුරුළු තාත්තා එන බවක් පෙනුණේ නෑ. අඬ අඬා හිටපු පැටවුන් ටික ඉබේටම නින්ද ගියා.

ඒත් කුරුලු අම්මා නම් ගොඩක් බයවෙලා හිටපු නිසා නින්දට ගියේ නැහැ. එකපාරටම කැලෑවෙන් ලොකු සුළඟක් සමග සද්දයක් ඇහෙන්න ගත්තා. කුරුලු අම්මා පැටවුන් ටිකත් තව තවත් තුරුලු කර ගත්තා.

එක පාරටම බෙණය තුළට කුරුලු තාත්තා පියඹා ආවා. රසම රස පළතුරු ගොඩක් කුරුලු තාත්තා හොටයෙන් එල්ලාගෙන ගෙනවිත් තිබුණා. පැටවුන් ටික තාත්තාව දැකලා සතුටෙන් කෑගැහුවා.



කුරුලු අම්මාට ගොඩක් සතුටුයි.
බඩ පිරෙනකන්ම පළතුරු කාලා සැවොම
නින්දට ගියා.



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම
සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20